නිජබිමේ නිදහස අහිමි වූ විට සත්තු මිනිසාට එරෙහි වෙති

පිටුව 20

ඉරිදින රසාංජලී
විනෝදය - විවේකය - විචාරය

2005 පෙබරවාරි මස 27 වැනි ද ඉරිදා

ගෙල බොදු අයිතිය ඉල්ලා සිටියත් ජාතිවාදියත් - ආගම්වාදියත් අපේ පියා ළඟ තිබුණේ නෑ

චන්ද්‍රගුප්ත මෙත්තානන්දගේ පිය ගුණ මතකයෙන්

ඇල්. එච්. මෙත්තානන්ද සිංහල බෞද්ධකම මුල් කරගත් රටක් ගැන කල්පනා කළ කෙනෙකි. ඔහු තුළ පැවතියේ බෞද්ධ භික්ෂුව විසින් පුරෝගාමිත්වය ගන්නා රටක් අනාගතයක් පිළිබඳ විශ්වාසයකි. නමුත් 1956 පෙරළිය තුළින් රටේ සිද්ධ වූයේ දේශමාමකයන් කල්පනා කළ ආකාරයේ වෙනසක් නොවේ. ඉන් පසුව ඔහු තුළ ඉතිරි වූයේ ඉටු නොවූ පරමාර්ථ රැසක් හා කළකිරීමක් පමණි. ඔහු කිසි විටෙක ජාතිවාදියෙක් නොවීය. හෙතෙම අපේක්ෂා කේලේ මේ රටේ බහුතර [illegible] සිංහල බෞද්ධ අයි[illegible] රැක දීම [illegible]නි.

නීතීඥ
චන්ද්‍රසිරි
සෙනෙවිරත්න

ඇල්. එච්. මෙත්තානන්ද පවුලේ උදවිය

දහනව වෙනි සියවසේ අවසන් භාගයයි. මුළු ලෝකයම එළඹෙන සියවස පිළිගැනීමට නව සළුපිළි සකසමින් සිටියේය. ලංකාව එවකට යටත් විජිතයකි. දේශප්‍රේමී ලාංකිකයෝ එතෙක් තමන් හැඳ සිටි විජාතික සළුපිළි පමණක් නොව, තම අනන්‍යතා යටපත් කළ සිය විජාතික නම් ගම් පවා යථාවබෝධයකින් යුතුව ඉවත් කරමින් සිටි කාලයකි.

ඉංග්‍රීසි යුගයේ මධ්‍යම පාන්තික ලාංකිකයෝ දරු මල්ලන්ට නම් තබද්දී ඉංග්‍රීසි නමක්ද ඇතුළත් කළහ. ඊට හේතුව තම දරුවන් ඉංග්‍රීසි ආණ්ඩුව යටතේ වැඩ කරද්දී සුද්දාට කතා කිරීමේ පහසුව සලකාගෙනය.

එළඹුණු නව සියවස සිංහලයාට නව රටක් ගැන සිහින දකින්ට හොඳ ආරම්භයක් විය. ජෝර්ජ් පීරිස් මලලසේකර, ගුණපාල මලලසේකර වූයේ, යම්කිසි විදග්ද චින්තනයක ප්‍රතිපලයක් වශයෙනි. සිල්වා සිරිසේන වූයේත්, ඩේවිඩ් ධර්මපාල වූයේත්, අනගාරික ධර්මපාලතුමාගේ උපහාසාත්මක ඇනුම් පද නිසා ය.

දකුණේ අම්බලන්ගොඩ කළුවඩුමුල්ලේ ලොකු සාත්තු හේවා තෝවිස් ද සිල්වා සිය දරුවන් නම් කෙළේ මෙත්තානන්ද, ජිනදාස, සුමනදාස සහ සිවනන්ද ආදී වශයෙනි. ඊට හේතුවූයේ මලලසේකරට තිබුණු විදග්ධභාවය නිසා හෝ අනගාරික ධර්මපාලතුමන්ගේ ඇනුම් පද නිසා හෝ නොවේ. එළඹෙන විසිවෙනි සියවසේ මගේ දරුවන්ට සුදු ආණ්ඩුවක් යටතේ වැඩ කිරීමට සිද්ධ නොවේය යන ශක්තිමත් පෙරදැක්මක් තිබුණු නිසාය.

කළුවඩුමුල්ලේ තෝවිස් ද සිල්වා දිළිඳු විය. එහෙත් අදීන සිතුම් ඇත්තෙක් විය. ඔහු ජීවිකාව පිණිස මුහුදු ගියේ නැත. හෙතෙම කන්ද උඩරට කඩුගන්නාවේ පුංචි ඉඩක සිට වතුකරයට අවශ්‍ය ලී තේ පෙට්ටි සපයමින් සිටියේ ය. ඔහු හොඳ වඩුවෙක් විය. තෝවිස් ද සිල්වා මුදලාලිටත් විරසූරිය කරලිනාහාමි මැතිනියටත් කුලුදුලේ ලැබුණේ පිරිමි දරුවෙකි. ඔහු උපන්නේ ක්‍රිස්තු වර්ෂ 1894 මාර්තු මස 19 වෙනි දින ය. මේ පියාණෝ සිංහලට නුහුරු සිය නමේ අගට යෙදුණු සිල්වා කෑල්ලෙන් පළමුව සිය දරුවා නිදහස් කළහ. මේ සියලු වෙනස්කම් සිදු කළ පසුව කුලුදුල් දරුවා නමින් ලොකු සාත්තු හේවා මෙත්තානන්ද විය. මේ අන් කවරෙකුවත් නොවේ. ආනන්ද නාලන්දා - ධර්මරාජ යන බෞද්ධ සිංහල මහ විදුහල් තුනේම විදුහල්පති තානාන්තර දැරූ ඇල්. එච්. මෙත්තානන්දය. තෝවිස් ද සිල්වාගේ ඒ ආකල්පය ජාතික ව්‍යාපාරයක් දක්වා ගෙන යන්නට ඔහුගේ කුලුදුල් දරුවා සමත් වූයේය.

ළමා මෙත්තානන්දයන්ගේ පළමු ගුරු බිම අම්බලන්ගොඩ ධර්මාශෝකය යි. ඉන් පසුව ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලයට ඇතුළු විය. 1912 වර්ෂයේ කේම්බ්‍රිජ් සීනියර් විභාගය සමත් විය. ඉන්පසුව පානදුර ශ්‍රී සුමංගල විදුහලේ ගුරුවරයෙක් විය. 1913 ලන්ඩන් මැට්‍රික් විභාගයෙන් සමත් විය. ඉන් පසුව කොළඹ ගුරු ඇබෑසි විදුහලෙන් ගුරු පුහුණුව ලැබීය. 1915 සිවිල් කලබල කාලයේ සුදු ආණ්ඩුව විසින් මෙතුමා ස්වේච්ඡා බළකායට කැඳවනු ලැබීය. ඇල්. එච්. මෙත්තානන්දයන් වසර 1919 සහකාර ගුරුවරයෙකු ලෙස ආනන්දයට කැඳවන ලද්දේ පී. ද ඇස්. කුලරත්න මහතා විසිනි.

නැවත කළුතර සිරි කුරුස විදුහලේ උප ගුරුවරයෙක් විය. 1922 පෙබරවාරි මස 22 වැනිදා ඔහු ලන්ඩන් බී. ඒ. උපාධිය ලබා ගත්තේ ය. 1923 වර්ෂයේ මෙත්තානන්ද මහතා සිය ජීවිතයේ සහකාරියගේ අත ගත්තේය. ඇය නමින් සීලියා වික්‍රමසූරිය මෙනෙවියයි. ඇය අම්බලන්ගොඩ පෝරඹ වික්‍රමසූරිය වලව්වේ දියණියක වූවා ය. එසේම සිංහල කලාකරුවන් අතර සුප්‍රකට සූරිය ලේබල් තැටි ව්‍යාපාරික ජෙරාල්ඩ් වික්‍රමසූරිය ගේ සොහොයුරියකි.

වසර ගණනාවක් පුරා මෙතුමා ආනන්දයේ සිසුන්ට ඉංග්‍රීසි-ලතින් භාෂාවන් ඉගැන්වීය. සුප්‍රකට නාලන්දා විද්‍යාලය 1924 ජනවාරි මස 1 වෙනිදා ආරම්භ කරන ලද්දේ මෙත්තානන්දයන් විසිනි. ඔහු එහි ප්‍රථම විදුහල්පතිවරයා විය.

1927 ශාස්ත්‍රපති ඇම්. ඒ. විභාගය සඳහා එංගලන්තය බලාගොස් 1930 දී පෙරළා සිය රට බලා පැමිණ ආනන්දයට එකතු විය. 1932 දී පී. ද ඇස්. කුලරත්න, මහනුවර ධර්මරාජ විදුහල්පති පදවියට පත්විය.

1932 සිට මෙත්තානන්ද ආනන්ද විදුහල්පති තනතුරේ වැඩ බැලීය. මේ කාලයේ ඔහුගේ සිසුන් අතර බර්නාඩ් සොයිසා, ඊ. ඒ. පේරුසිංහ වැනි විශිෂ්ටයන් විම සුවිශේෂ ය. 1936 මෙත්තානන්ද ධර්මරාජයටත් කුලරත්න නැවත ආනන්දයටත් මාරු වී ගියහ. ධර්මරාජ ඉතිහාසයේ ඉතා අර්බුදකාරී යුගය මෙය විය හැකිය. සියලු අභියෝග ජයගත් මෙත්තානන්දයෝ ධර්මරාජය සුරක්ෂිත කළහ. 1945 නැවත කොළඹ ආනන්දයට ස්ථාන මාරුවී යන විට, ධර්මරාජය මේ රටේ අද්විතීය බෞද්ධ පාසලක්ව තිබිණි. 1954 වසරේ ඇල්. එච්. මෙත්තානන්දයෝ විශ්‍රාම ගත්හ.

රාජකාරී ජීවිතයේ අවසාන අවුරුදු 10 තුළ ඔහුගේ චරිතය මේ රටේ අද්විතීය තැනක ස්ථානගතව තිබිණි. මේ යුගයේ ඔහුගේ හඬට මුළු රටම කන් යොමා සිටියේය. ආනන්ද වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයේ විදුහල්පතිගේ කථාව රටේ ජාතික පුවත්වත්වල ප්‍රධාන සිරස්තල බවට පත්වූයේ. ඒවායේ ඇති හරබර බව නිසාමය. 1952 වන විට මේ තුළ කිසියම් ජාතික අවශ්‍යතාවක් පැන නැගිණි. මෙතුමා සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපති පදවියට පත්විය. 1953 දෙසැම්බර් මස 27 දින කෑගල්ලේදී ඓතිහාසික බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාවක් පත්කර ගැනීමට තීරණය කෙරිණි. මෙම පරීක්ෂණ සභාවට බෞද්ධ අධ්‍යාපනය- බෞද්ධ විහාර දේවාල ඉඩම් - සිංහල භාෂාව යන විෂයන් අධ්‍යයනය කිරීම පැවරිණි.

මෙම කොමිෂන් සභා වාර්තාවේ බෞද්ධ අධ්‍යාපනය නම් පරිච්ඡේදය ලියැවුණේ මෙත්තානන්දයන් අතිනි.

බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාව නියෝජනය කරන ලද්දේ පූජ්‍ය අඹන්වැල්ලේ සිද්ධාර්ථ, පූජ්‍ය හාල්යාලේ සුමනතිස්ස, පූජ්‍ය පලන්නෝරුවේ විමලධම්ම, පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රෙය, පූජ්‍ය හපුවලානේ ශ්‍රී ඤාණාලෝක, පූජ්‍ය කොටහේනේ පඤ්ඤාකිත්ති, පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ යන මහ සඟරුවනද මහාචාර්ය ජී. පී. මලලසේකර, ආචාර්ය පී. ද ඇස්. කුලරත්න, එල්. එච්. මෙත්තානන්ද, ඩී. සී. විජේවර්ධන, ආචාර්ය තෙන්නකෝන් විමලානන්ද, ටී. බී. ගොඩමුන්නේ, එම්. ටී. යූ. ද සිල්වා, එම්. ඩී. සී. අබේරත්න යන ගිහි භවතුන් ද විසිනි.1956 මාර්තු 3 වැනි දින ආනන්ද විද්‍යාලයේදී මෙම බෞද්ධ තොරතුරු පරීක්ෂක සභා වාර්තාව දස පනතක් සමඟ පිළිගන්වන ලදී. 1956 මහා පෙරළිය සිදු කළේ මේ සංසිද්ධියයි.

එදින "බෞද්ධ පෙරමුණ" නම් පත්‍රයක් නිකුත් විය. එය එල්. එච්. මෙත්තානන්දගේ ය. එහි ඔහු සිය අරමුණු මෙසේ දක්වා තිබිණි.

"අවුරුදු 2500 ටත් පැරණි ඉතිහාසයක් ඇති සිංහල බෞද්ධයින් වූ අපි කිසි කලෙක අන් ජාතියකට හෝ ආගමකට හෝ හානි නොකළෙමු. මතුවටද හානි නොකරන්නෙමු. එහෙත් යම් සේ අපේ මුතුන් මිත්තෝ සිය ජාතිය හා ආගම රැක ගැනීම සඳහා ජීවිත පූජාවෙන් සටන් කළෝද, එසේම දැනුදු අපි අපේ නැතිවූ අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා එක්සත්ව සටන් කරමු."

මෙත්තානන්දලාගේ අධිරාජ්‍ය විරෝධී දේශප්‍රේමී පන්නාරය මොට කෙළේ පටු ජාතිවාදීන් විසිනි. ජාතිවාදී විස කවා රට ලේ විලක් බවට පත් කළෝ කවුදැයි ඉතිහාසය දැනටම තීරණය කර හමාර ය.

ඔහුගේ දේශපාලනයේ පදනම වූයේ මේ රට සිංහලයන්ට බෞද්ධයන්ට ලියාදීම නොවේ. බහුතරය වන සිංහල බෞද්ධයන්ගේ උරුමය නිසි පරිදි ආරක්ෂා කර දීමය.

ඔහු 1936 මැලේරියා මර්දන ව්‍යාපාරයත්, 1935 සූරිය මල් ව්‍යාපාරයත් ශක්තිමත් කළේ ස්වදේශයට ශක්තිමත් පදනමක් අපේක්ෂාවෙනි. 1956 පෙරළිය පිටුපස සිටි මෙත්තානන්දයන්ට රට ඇල්ලීමේ අපේක්ෂාවක් නොවීය. 1959 ඔහු ධර්ම සමාජ පක්ෂය පිහිටුවා ගත්තේ පොදු උවමනාවක් කේවෙල් කිරීමට ය. 1960 මැතිවරණයේ දී ධර්ම සමාජ පක්ෂය හා පිලිප් ගුණවර්ධනගේ මහජන එක්සත් පෙරමුණ එකට එක් විය. නමුත් ඒ සටන සාර්ථක නොවී ය. මේ විශිෂ්ට අධ්‍යාපනඥයා, ශ්‍රේෂ්ඨ ශ්‍රී ලංකා පුත්‍රයා වසර 73 ක් ආයු වළඳා 1967 නොවැම්බර් 1 වැනිදා ජාතියෙන් සමු ගත්තේ ය.

එල්. එච්. මෙත්තානන්ද පවුලේ දරුවන් 5 දෙනයි. වැඩිමහල් දරුවා මම, චන්ද්‍රගුප්ත මෙත්තානන්ද, රාජසිංහ මෙත්තානන්ද, අසෝක මෙත්තානන්ද, ඉන්ද්‍රානි සහ කමලාදේවි. අනෙක් හතර දෙනා ය. දරුවන් වන අප ඔහුට තවත් ශිෂ්‍යයන් කිහිප දෙනකු පමණක් විය. පාසලේ දරුවන් මෙහෙයවන රටාවම ගෙදර අපටද පොදු විය. ගෙදරදී අප වඩා ගෙන, බදාගෙන හුරතල් කළේ නැත.

ඔහුගේ සිසුන් දන්නා පරිදි ඔහු සැර පරුෂ පාලකයෙක්, තද විනයක් අපේක්ෂා කළ ගුරුවරයෙක්. ඔහුගේ ඒ ගති සිරිත් හැමදාම තිබුණා. කලෙක හොඳ අනාගතයකට හිමිකම් කීමේ රහස එයයි. මට මතකයි ඉන්ද්‍රා නංගී සරසවියට ගියේ ආනන්දයේ අධ්‍යාපනය ලැබීමෙන් පසුවයි.

අපේ සොහොයුරියන් දෙදෙනාම ඉතා සාර්ථක ලෙස උසස් අධ්‍යාපනය නිම කළා. වෛද්‍ය කමලාදේවි එදිරිවීර දක්ෂ වෛද්‍යවරියක්. ඉන්ද්‍රාණි ගුණසේකර පශු වෛද්‍යවරියක් ලෙස සේවය කළා. බාල පිරිමි සොහොයුරන් දෙදෙනකු විදේශගතව සිට ජීවිත සාර්ථකව ගෙවුවේ ඒ පාලනය නිසා.

මුල් පවුලේ අපේ එකම නැන්දාගේ පුතා සී. පී. පටුවතවිතාන උප කුලපතිවරයෙකු වී සිටියා. මේ රටේ තවත් උප කුලපතිවරයෙකු වූ එල්. එච්. සුමනදාස බාප්පා මේ රටේ ඉහළට ගිය අධ්‍යාපනඥයෙක් බවට පත් වුණා. එසේ එකම පවුලේ දෙදෙනාම ජෝෂඨ ඉංජිනේරුවරුන් වූවා සේම එකම පවුලේ දෙදෙනාම උපකුලපති වරුන්වීම සුවිශේෂ සිද්ධියක්.

යුරෝපීය ඇදුමෙන් එංගලන්තයට ගිය තාත්තා නැවත ලංකාවට ආවේ ආර්ය සිංහල ජාතික ඇඳුම ඇඳගෙනයි.

පෙරදිග සංස්කෘතිය තුළ වැඩුණු කෙනෙකුගේ පැවැත්ම බටහිර සංස්කෘතිය විසින් සෝදා පාළුවට ලක් කරන බව ඔහු විශ්වාස කළා. එංගලන්තයේ සිටි කාලේ ඔහුට එය තහවුරු වුණා.

එකල මේ රටේ තිබුණු එංගලන්ත අනුකරණය. ඔහු පිළිකුල් කළා. එය අපේ ඓතිහාසික ශික්ෂණයේ පැවැත්මට හානි කර බව විශ්වාස කළා. තාත්තා ගුරුවරයෙකු ලෙස විදුහල්පති වරයෙකු ලෙස සිය මුළු ජීවිත කාලයම කැප කළේ ඒ තත්ත්වයෙන් රට මුදා ගන්නයි. ඔහු පැවැත්මෙන්ම බෞද්ධයෙක් වුණා. සිය සිසුන්ට මෙන්ම තම දරුවන්ටත්, ආදර්ශවත් ජීවිතයක් ගත කළා. ඔහු කිසි දිනෙක පන්තියට පමාවී ආවේ නැහැ. කලින් පන්තිය අවසාන කළේත් නැහැ.

ඔහු ආනන්ද විද්‍යාලයේ ලතින් ඉගැන්වීම නතර කළා. ඒ වෙනුවට පාලි බස ඉගැන්වුවා. ධම්මපද ගාථා සිංහල කවි තරමට ළමයින්ට හුරු වුණා. එයින් ආනන්ද දරුවන්ගේ ජීවිත ප්‍රභාමත් වුණා. පළමුවැනි දෙවැනි පන්තිවල සිට ආනන්දයේ සිංහල-දෙමළ භාෂා ඉගැන්වීම අනිවාර්ය කළා. පාසලේ සාහිත්‍ය කටයුතුවලදී සිංහල-දෙමළ භාෂා දෙකටම වැදගත් තැනක් ලබා දුන්නා. එකල ආනන්දියන්ට රටේ උතුර-දකුණ වෙනසක් නොවූයේ මේ නිස යි.

මේ යුගයේ ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයේ විෂය මාලාවේත් දෙමළ බස ඉගැන්වූවා. ඒ තත්ත්වය මුළු රටේම තිබුණා නම්, මේ ජන වාර්ගික ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ. යටත් විජිත වාදීන් මේ රට භේද කළා. වසර දෙදහස් පන්සියක් කල් පැවති ජාතික සමඟිය පළුදු කළා. තාත්තා මේ තත්ත්වයන්ට පිළියම් කෙළේ අධ්‍යාපනඥයෙකු විදියට යි. ග්‍රීක භාෂාව ඉගැන්වීම ද නතර කළා. ඒ වෙනුවට වෘත්තීය දැනුම පාසලට එක් කළා.

මගේ පියාගේ දෙවැනි මනමාලයා ලෙස ගියේ ගුණපාල මලලසේකරයි. තාත්තා මේ රටේදී දර්ශනය - ලතින් - සම්භාව්‍ය ඉංග්‍රීසි සාහිත්‍යය හදාරා තිබුණා. 1927 දී ඔහු එංගලන්තයට යන විට මට අවුරුදු තුනහමාරයි. ඔහු එහිදී සමය සමයාන්තර දර්ශනය ගැන තුලනාත්මක අධ්‍යයනයක් කළා. තාර්කිකව ඔහු දැක්වූ කරුණුවලින් බටහිර ආගම් විවේචනය වුණා. එංගලන්තයේ ඇන්ග්ලිකන් ඇදහීම් නිසා සෙනෙට් සභාවට ඔහුගේ මතවාද විස වුණා. ඒ උපාධි නිබන්ධනය විශ්ව විද්‍යාලය පිළිගත්තේ නැහැ. මේ නිසා තාත්තාට ශාස්ත්‍රපති උපාධිය (ඇම්. ඒ.) ලැබුණේ නැහැ. ලැබුණු ඩිප්ලෝමා සහතිකය රැගෙන ඔහු ආපසු ආවා. තාත්තා ඒ ගැන පසුතැවිලි වුණේ නෑ. ඔහු රටේ අනාගතය ගැන විශ්වාස කළා. නව රටක් නව ජාතියක් නිර්මාණය කිරීම ඔහු පාසලින් ආරම්භ කළා.

තාත්තාගේ සේවය මුළු රටම අගය කළා. නමුත් ඉතිහාසය ඔහු එක් වරක් මඟ හැරියා.

ඒ තමයි නාලන්දා මහා විද්‍යාලය ආරම්භ කිරීමේ ගෞරවය ඔහුට නොලැබීම. මේ කීර්තිමත් පාසලේ ආරම්භක මුල් වසර පවත්වාගෙන ගියේ තාත්තා විසින්මයි. නමුත් නාලන්දාව රජය පිළිගත්තේ තාත්තා එතැනින් පිටවී ගිය පසුව 1925 නොවැම්බර් මස 01 වැනිදා ය. මේ සංසිද්ධීන් නිසා නාලන්දා මහා විද්‍යාලයේ පළමුවෙනි විදුහල්පතිවරයා ලෙස ගුණපාල මලලසේකර මහතා ඉතිහාස ගත වුණා.

තාත්තා ගැන කතා කරන මම ඔහුගේ දරුවෙකු ලෙස මේ ගැන සඳහන් කළ යුතුයි. අපේ තාත්තා මෙහිදී නිහඬව සිනාසුණා. ඔහුට තිබුණේ සේවය කිරීමේ රුචියක් මිස, ඉතිහාස ගතවීමේ රුචියක් නොවෙයි.

22 වැනි පිටුවට....